# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 46 දරන
# සත්ව (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 46 දරන සත්ව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 3/79.

## 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 46 දරන සත්ව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1958 අංක 29 දරන සත්ව පනතේ 2 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1958 අංක 29 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "මේ උප වගන්තියෙහි" යන වචනවලින් ආරම්භව "අදහස් වන්නේ ය" යන වචනවලින් අවසන් වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"මේ උපවගන්තියෙහි නිසි බලධරයා යන්නෙන් ආණ්ඩුවේ පශු ශල්‍ය වෛද්‍යවරයකු හෝ ඔහු විසින් ලියවිල්ලකින් නම් කරනු ලැබූ නිලධරයකු හෝ, පළාත් පාලන ආයතනයක් විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලැබූ පශු ශල්‍ය වෛද්‍යවරයකු හෝ අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව පළාත් පාලන ආයතනය විසින් පත් කරන ලද වෙනත් යම් නිලධරයකු හෝ අදහස් වන්නේ ය.".

(ආ) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(3) මේ වගන්තියෙහි "එළදෙන" යන්නට මී දෙන ද ඇතුළත් වන අතර, "එළ වැස්සිය" යන්න ඒ අනුව තේරුම් ගත යුතු ය.".

3. 1968 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(1) යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත හෝ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් තුළට හෝ යම් පරිපාලන දිස්ත්‍රික්කයකින් බැහැරට සතුන් ගෙන යාම තහනම් කිරීම සීමා කිරීම පාලනය කිරීම හෝ විධිමත් කිරීම;";

2—ඒ 090840—7,610 (87/05)

(2) එහි (3) වන ඡේදයේ "පරීක්ෂා කිරීම; සහ" යන වචන වෙනුවට "පරීක්ෂා කිරීම." යන වචන ආදේශ කිරීමෙන්, සහ

(3) එහි (4) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(5) සතුන් ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍ර ඉල්ලා සිටීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය; සහ

(6) ප්‍රවාහන අවසර පත්‍ර වෙනුවෙන් ගාස්තු නියම කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3අා වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3අා වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "හෝ කෘෂිකර්ම නිලධරයා" යන වචන වෙනුවට, "හෝ රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "මේ වගන්තියේ කාර්ය සඳහා" යන වචනවල සිට "අදහස් වේ" යන වචන දක්වා වූ සියලු වචන අත්හැරීමෙන්.

3ඇ සහ 3ඈ අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3අා වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති, ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඇ සහ 3ඈ වගන්ති වශයෙන් බල පැවැත්විය යුතු ය :—

"සතුන් රැගෙනයාම වෙනුවෙන් ප්‍රවාහන අවසර පත්‍ර.

3ඇ. (1) යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත හෝ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් තුළට හෝ යම් පරිපාලන දිස්ත්‍රික්කයකින් බැහැරට හෝ යම් සතකු ප්‍රවාහනය කිරීම සඳහා ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ කොට්ඨාසයක දිසාපතිවරයා විසින් ඒ කරුණු සඳහා නිකුත් කරන ලද ප්‍රවාහන අවසර පත්‍රයක බලය යටතේ මිස, කිසිම තැනැත්තකු විසින් යම් සතකු ප්‍රවාහනය කරනු නොලැබිය යුතු ය.

(2) ප්‍රවාහන අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, යම් සතකු ප්‍රවාහනය කරනු ලබන්නේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද නැතහොත් යම් පරිපාලන දිස්ත්‍රික්කයකින් බැහැරට ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ කොට්ඨාස යෙහි දිසාපතිවරයා වෙත, නියම කරනු ලැබ ඇති ආකෘති පත්‍රයෙහි ඉල්ලුම් කරනු ලැබිය යුතු අතර, නියමිත ගාස්තුව ද ඒ සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සෑම ප්‍රවාහන අවසර පත්‍රයක් ම, කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරන ලද දිනයේ සිට මාස තුනක කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය.

මේ කොටස යටතේ වැරදි, සංඥේය වැරදි වන බව.

3ඈ. මේ කොටස යටතට අයත් වන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතට අයත් වන සියලු වැරදි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනයේ කුමක් ඇතුළත් වුව ද ඒ නොතකා, ඒ පනතේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා සංඥේය වැරදි විය යුතු ය.".

5ඇ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

6. 5 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" නියම නොකරන ලද ස්ථානවල සතුන්ගේ හන ලකුණු තැබීම වරදක් බව.

5ඇ. තම ගවයන්ට හන සළකුණු යෙදිය යුතු බවට 5 වන වගන්තිය යටතේ නියම කරනු ලැබ සිටින තැනැත්තකු විසින්, ගවයන් හංවඩු ගැසීමට අදාළව මේ පනත යටතේ බලපවත්වන්නා වූ නියෝගවල නිශ්චිතව සඳහන් ස්ථාන නොවන ස්ථානවල, ගවයන් හන සළකුණු යොදවා ගැනීම කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" ගවයින්ගේ විස්තර හා හංවඩු ලකුණු පිළිබඳ වාර්තාව අයිතිකරුවන් විසින් රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයා වෙත සැපයිය යුතු බව.

6. තමාට අයත් ගවයින් සිටින්නා වූ සෑම තැනැත්තකු විසින් ම, ඒ එක් එක් ගවයාගේ විස්තර හා හන ලකුණු පිළිබඳ වාර්තාවක්, නියමිත ආකෘතියට අනුව, එම ගවයින් තබා සිටින්නා වූ ප්‍රදේශයේ රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයා වෙත එක් එක් වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දින පසුවීමට පෙර සපයනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" ගව ලේඛනයක් පවත්වාගෙන යාම හා ගව වවුචර නිකුත් කිරීම රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයාගේ කාර්යය බව.

7. සෑම රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයකු ම විසින්—

(අ) ස්වකීය ප්‍රදේශය තුළ සිටින්නා වූ ගවයින්ගේ විස්තර හා හන ලකුණු පිළිබඳ ලේඛනයක් නියමිත ආකෘතියට අනුව පවත්වා ගෙන යා යුතු ය ; තවද

(ආ) ගවයින් හන තැබීමට අදාලව මේ පනත යටතේ වලංගුව පවත්නා නියෝගවලට අනුකූලව හන තැබූ ගවයින්ගේ අයිතිකරු වෙත, එවැනි එක් එක් ගවයා සම්බන්ධයෙන් වවුචරයක් නියමිත ආකෘතියට අනුව නිකුත් කිරීම හෝ නිකුත් කිරීමට සැළැස්වීම හෝ කළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" ප්‍රදේශය දැක්වෙන ලකුණුවලින් සතකු හංවඩු තැබීමට අයිතිකරුට විධාන කිරීමට පශු ශල්‍ය වෛද්‍යවරයකු සතු බලය.

9. යම් ප්‍රදේශයක රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයකු විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, යම් සතකු තබා ඇති ප්‍රදේශය දැක්වෙන පරිදි ඒ රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් ලකුණුවලින් ඒ රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත ඒ සතා හන තබන ලෙසට ඒ සතාගේ අයිතිකරුට විධාන කරනු ලැබිය හැකි අතර, ඒ අයිතිකරු විසින් ඒ විධානය ක්‍රියාවේ යෙදවිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියෙහි " රුපියල් පනහක " යන වචන වෙනුවට " රුපියල් සියයක " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 19අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**11.** 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" හිමිකම් නොපෑන ලද සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

19අ. 14 වන සහ 15 වන වගන්තිය යටතේ අල්ලා බැඳ රඳවා ගන්නා ලද යම් සතකු සම්බන්ධයෙන් එසේ අල්ලා ගෙන රඳවා ගන්නා ලද දිනයේ සිට දින තිහක් ඇතුළත, එහි අයිතිකරු විසින් හෝ අයිතිකරු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් හෝ හිමිකම් පෑමක් කරනු නොලබන අවස්ථාවක එම සතා රඳවා ගන්නා ලද පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින්, ඒ සඳහා බලය පවරන ලද තැනැත්තකු විසින්, එම සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය යුතු අතර,—

(අ) එම විකිණීම පෞද්ගලික ඉඩමකට අයුතු ඇතුළුවීම සම්බන්ධයෙන් රඳවා ගනු ලැබූ සතකු සම්බන්ධයෙන් වන විට, එම විකිණීමෙන් ලැබෙන මුදලින් එම අයුතු

ඇතුළුවීම නිසා සිදු වූ ද නියමිත ආකාරයට තක්සේරු කරන ලද්දා වූ ද අලාභ ද, රඳවා තබා ගැනීමේ කාලය තුළ එම සතා නඩත්තු කිරීම සඳහා දරන ලද සාධාරණ වියදම් ද, එම ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට ගෙවිය යුතු අතර යම් ඉතිරියක් වේ නම් එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(ආ) එම විකිණීම, පෞද්ගලික ඉඩමක් නොවන යම් ඉඩමකට සතකුගේ අයුතු ඇතුළුවීම සම්බන්ධයෙන් වන විට, එම විකිණීමෙන් ලැබෙන මුදල, ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

"විනාශ කරන ලද සත්ව කුණප බැහැර කිරීම.

24. 22 වන වගන්තියේ හෝ 23 වන වගන්තියේ විධිවිධාන යටතේ වෙඩි තබන ලද්දා වූ හෝ අන්‍යාකාරයකින් විනාශ කරන ලද්දා වූ සෑම සතකුගේම අයිතිකරුට ඒ සතාගේ කුණපය ඉවත් කර ගැනීමට හිමිකම ඇති අතර, එය ඉවත් කර ගැනීමෙහි ලා හිමිකම් ඇති යම් තැනැත්තකු විසින් ඒ කුණපයට හිමිකට පෑමක් නොකරනහොත්, ඒ සතා වෙඩි තබන ලද්දේ හෝ අන්‍යාකාරයකින් විනාශ කරන ලද්දේ යම් ප්‍රදේශයක දී ද ඒ ප්‍රදේශයේ රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකු විසින් කුණපය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය යුතු ය. තව ද එම විකිණීමෙන් උපලබ්ධ වන මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.".

**13.** 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *24 අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.*

"අයුතු ලෙස ඇතුළු වූ සතුන්ගේ අයිතිකරුවන් ගෙන් උඩ මුදල අයකර ගැනීම.

24අ. (1) 14 වන වගන්තිය හෝ 15 වන වගන්තිය හෝ යටතේ යම් සතකු අල්ලා ගෙන, රඳවා ගන්නා ලද අවස්ථාවක, එම සතා රඳවා ගෙන තිබෙන පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින්, එම සතාගේ අයිතිකරු හෝ එම සතා භාරව සිටින තැනැත්තා හෝ වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම වගන්තිය යටතේ අලාභ හෝ වියදම් වශයෙන් ඔහුගෙන් ලැබිය යුතු

යම් මුදලක් එම දැන්වීමෙහි සඳහන් කාල සීමාව තුළ එම දිසාපතිවරයා වෙත ගෙවන ලෙස නියම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දිසාපතිවරයෙක් වෙත ගෙවන ලද යම් මුදලක්—

(අ) එම මුදල යම් පෞද්ගලික ඉඩමකට සිදු වූ අලාභ හානි සම්බන්ධයෙන් ගෙවා තිබෙන අවස්ථාවක, දිසාපතිවරයා විසින්, එම පෞද්ගලික ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(ආ) එම මුදල් පෞද්ගලික ඉඩමක් නොවන යම් ඉඩමකට අයුතු ඇතුළුවීමක් සම්බන්ධයෙන් ගෙවා තිබෙන අවස්ථාවක, දිසාපතිවරයා විසින් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "රුපියල් විස්සක" යන වචන වෙනුවට "රුපියල් සියයක" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියෙහි "තැනැත්තෙක්ම" යන වචනයේ සිට "යටත් විය යුතුය" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"තැනැත්තෙක්ම රුපියල් දෙසිය පණහක් නොඉක්මවන දඩයකට නැතහොත් මාස දෙකකට වැඩි නොවන කාලයක් සඳහා බරපතල වැඩ රහිත සිර දඬුවමකට ද, වරද දෙවැනි වරට හෝ තදනන්තරව සිදු කිරීම සඳහා රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට නැතහොත් මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා බරපතල වැඩ රහිත සිර දඬුවමකට ද යටත් විය යුතුය.".

37ආ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**16.** 37අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 37ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයන් සාම නිලධරයන් වශයෙන් සැලකිය යුතු බව.

37ආ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් සාම නිලධරයකු වෙත පවරනු ලැබූ යම් බලයක්, මේ පනත යටතේ වූ යම් වර දක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, සාම රජයේ පශු ශල්‍ය වෛද්‍යවරයකුම පළමුව සඳහන් පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ලෙස සැලකිය යුතු ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "සතකු" යන්නෙහි අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"සතකු" යන්නෙන් එළ හරකකු හෝ මී හරකකු අද හස් වන අතර, IV වන කොටසෙහි දී බැටළුවකු, එළුවකු, ඌරකු හෝ කුකුළු යන සතකු ඊට ඇතුළත් වේ ;

(ආ) "හන සළකුණු තැබීම" යන්නෙහි අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"හන සළකුණු තැබීම" යන්නට කන් තාහඩු දැමීම, කනෙහි පච්ච කෙටීම, රසායනික ද්‍රව්‍ය යොදා හඳුනා ගැනීමේ අකුරු හෝ අංක ලකුණු කිරීම, අයිසිසිල් ක්‍රමයට ලකුණු කිරීම සහ කන් කෙටීම ඇතුළත් වේ ;

(ඇ) "අධ්‍යක්ෂවරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍යය පිළිබඳ අධ්‍යක්ෂවරයා අදහස් වේ ;

(ඈ) "පශු ශල්‍ය වෛද්‍යවරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"පශු ශල්‍ය වෛද්‍යවරයා" යන්නෙන්, 1956 අංක 46 දරන පශු ශල්‍ය වෛද්‍යවරයන් හා වෘත්තිකයන් පිළිබඳ පනත යටතේ ලියාපදිංචි වූ පශු ශල්‍ය වෛද්‍යවරයකු අදහස් වේ." ; තවද

(ඉ) II සහ III කොටස්වල "හරක්" යන පදයෙන් එළ හරක් හෝ මී හරක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 යි. (විදේශීය) රු. 286 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.